# දඹදෙණි යුගයේ පාලි කාව්‍යයන්හි දක්නට ලැබෙන සුවිශේෂතා

ආධුනික කථිකාචාර්ය වැලිවිට සොරත හිමි

ලක් ඉතිහාසයෙහි දඹදෙණි යුගය ආරම්භ වන්නේ ක්‍රි. ව. 1220[1] (ඇතැම් තැනක 1232)[2] දීය. කාලිංග මාඝගේ පොළොන්නරු ආක්‍රමණයෙන් පසු අවුරුදු විස්සක් පමණ කාලයක් රට මුදවා ගැනීමට සමත් කෙනෙක් ලක්දිව නොවීය. එම ව්‍යසනයෙන් රට බේරා ගැනීමට ඉදිරිපත් වූයේ දඹදෙණියේ දුර්ගයක් සාදා, එහි වාසය කළ iii විජයබාහු නම් ක්ෂත්‍රියායි. ඔහු මායා රටෙහි සිටි සිංහල ප්‍රධානීන් එකතු කරවාගෙන, යුධ සංවිධානය කොට, කාලිංග මාඝ පන්නා දඹදෙණි පව්ව මත මාළිගාවක් කරවාගෙන රජ කළේය.[3] එහෙත් ඔහුට මාඝ සම්පූර්ණයෙන් පරාජය කරන්නට නොහැකි වුණි. ඒ කාලයේ මාඝ තෙමේ ද පොළොන්නරුවෙහි පමණක් තම රාජ්‍ය බලය ගෙන ගියේය.[4] විජයබාහු රජතුමා විසින් දඹදෙණිය රාජධානියක් වශයෙන් මුල්වරට පිහිටුවා ගනු ලැබීමත් සමඟ ලක්දිව එතෙක් රජරටට පමණක් සීමා වී තිබූ රාජධානි ක්‍රමය ක්‍රමයෙන් බිඳ වැටී මායා රටට සංක්‍රමණය වන්නට විය. එය ලක්දිව තුන්වන ප්‍රධාන රාජධානිය ද විය.

ක්‍රි. ව. 1220 න් ආරම්භ වූ දඹදෙණි රාජධානිය තුළ රජවරු පස් දෙනෙක් රාජ්‍ය බලය ගෙන ගියහ. iii වන විජයබාහු (ක්‍රි. ව. 1220 - 1224) ii පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1224 - 1269) iv වන විජයබාහු (ක්‍රි. ව. 1269 - 1272) i භුවනෙකබාහු (ක්‍රි. ව. 1272 - 1283) iii පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1283 - 1293) යන රජවරු එසේ පාලනය ගෙන ගිය අය වූහ.[5] මේ රජවරු අතරින් සුවිශේෂී රජ කෙනෙක් වන්නේ ii පරාක්‍රමබාහු රජතුමාය. ඔහු රාජ්‍යයට පත් වූ පළමු වර්ෂයේ දීම අනුරාධපුරයෙහි සිටි කාලිංග මාඝ පන්නා දමා මුළු ලක්දිව එක්සේසත් කළේය. එයින් රටේ පැවති අවුල් සහගත තත්වය නැති වී රට සාමකාමී විය. සාමාජික අධ්‍යාපනික තත්වය දියුණු විය. විනාශ වී ගිය වෙහෙර විහාර පොත්පත් ආදිය ප්‍රතිසංස්කරණය කරන ලදි. චෝළ දේශය, මලය අර්ධද්වීපය, තම්බරට්ඨ වැනි ප්‍රදේශවලට පලාගොස් සිටි උගත්, විනයධර භික්ෂූන් වහන්සේලා නැවත කැඳවා පළාබත්ගල ආරාමයක් කරවා පූජා කරන ලදි. එසේම ශාසනය කෙරෙහි දක්වන ලද අනුග්‍රහයක් වශයෙන් ශාසන ශෝධනය කිරීම, කතිකාවත සම්මත කිරීම, නොකඩවා උපසම්පදා මංගල්‍යය පැවැත්වීම, දෙව්නුවර පෙරහැර ආරම්භ කිරීම, ශ්‍රී දළදා පූජාව පැවැත්වීම ආදිය ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි.[6] මොහුගෙන් පසු සිටි රජවරු ද මෙම ක්‍රියා පිළිවෙත ම අනුගමනය කර ඇත. එම නිසා පොළොන්නරු යුගයේ අවසාන භාගයේ දී බිඳ වැටී ගිය සාමාජික, අධ්‍යාපනික, ආර්ථික, දේශපාලනික, ආගමික හා සාහිත්‍යයික තත්වය විශාල වශයෙන් දියුණුවක් කරා පිය නඟන්නට පටන් ගැණුනි.

දඹදෙණි යුගයේ අධ්‍යාපනික වශයෙන් දියුණුවක් ඇති වූ බව දැකිය හැකිය. විනාශ වී ගිය පොත් පත් සංස්කරණය කරන අතර ම නව රචනාවන් ද මේ යුගයේ ඇති වූ බව දක්නට ලැබේ. ඒ අනුව කාව්‍ය ග්‍රන්ථ සමුදායක් බිහි වීම මේ යුගයේ දක්නට ලැබෙන සුවිශේෂී අංගයක් ලෙස පෙන්වා දිය හැකිය. මීට ප්‍රථම පාලි කාව්‍ය ග්‍රන්ථ රචනා වී ඇතත් දඹදෙණි යුගයේ සුවිශේෂිත වූ කාව්‍ය ග්‍රන්ථ කිහිපයක් රචනා වී ඇත. 'කාව්‍ය' යනුවෙන් හඳුන්වනු ලබන්නේ ගද්‍ය, පද්‍ය හා මිශ්‍ර හෙවත් චම්පූ යන කොටස් තුනයි. ඒ අනුව මෙම යුගයේ රචිත පාලි ගද්‍ය, පද්‍ය, චම්පූ කාව්‍ය කෘති මෙසේ වර්ග කළ හැකිය.

| | |
|---|---|
| සද්ධම්මෝපායනය | රසවාහිනී |
| මහාවංසය (දෙවන කොටස චූලවංසය) | සමන්තකූටවණ්ණනා |
| ථූපවංසය | කෙසධාතුවංසය |
| හත්ථවනගල්ලවිහාරවංසය | ජිනචරිතය |
| පජ්ජමධු | |

දඹදෙණි යුගයේ රචිත මෙම කාව්‍ය කෘතිවල එන සුවිශේෂතා හඳුනාගැනීමට නම් ඊට පෙර පැවති කාව්‍ය ග්‍රන්ථ කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතුය. ඒ අනුව කාව්‍ය ග්‍රන්ථයන්හි ආරම්භය බුද්ධකාලය දක්වා ම විහිදී ඇත. පොදුවේ සියලු ම ආගම්වල ඇති මෙම කාව්‍ය විශේෂය ආගම් ප්‍රචාරය කිරීම සඳහා ද පැවති එකක් ලෙස පෙන්වා දිය හැකිය. බ්‍රාහ්මණ

සමාජ දර්ශනයෙහි ප්‍රධාන ආගමික මාධ්‍ය වූ යාග හෝම පැවැත්වීම සඳහා වෛදික ග්‍රන්ථවල එන සූක්ත, යාදිනි යන නම්වලින් හඳුන්වන ලද කාව්‍ය විශේෂය යොදාගෙන ඇති බව දැකිය හැකිය. බෞද්ධ සාහිත්‍යයේ ද ත්‍රිපිටකයේ නොයෙක් ස්ථානවල එන ගාථා උපයෝගී කරගෙන ධර්ම ප්‍රචාර කටයුතු සිදුකර ඇත. ජෛන ධර්මයේ ද ගාථා සප්තසති වැනි ශෘංගාරාත්මක කාව්‍ය කෘති නිර්මාණය වී ඇති බව පෙනේ. මේ අයුරින් සියලු ම ආගම්වල පෝෂණය සඳහා කාව්‍ය ද එක් අංගයක් වූ බව පෙනේ.

ත්‍රිපිටකයට ඇතුළත් දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර යන නිකාය ග්‍රන්ථවල සූත්‍ර පාඨවලට අමතරව ගාථා කොටස් ද දක්නට ලැබෙයි. එහෙත් 'කාව්‍ය' යන නාමයෙන් හැඳින්විය හැකි ගාථා බොහෝමයක් දක්නට ලැබෙන්නේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ අතර ධම්මපද. උදාන, ථේරගාථා, ථේරීගාථා, සුත්තනිපාත, අපදාන වැනි කෘති තුළය. මෙම මුල් දේශනාවන්හි එන ගාථාවන් හඳුන්වා ඇත්තේ 'භාවගීත' යන නමිනි. භාවගීත යනු භාවාත්මක ප්‍රකාශන ඇතුළත් ගාථා විශේෂයයි. ශ්‍රාවක-ශ්‍රාවිකාවන් තම ගිහි ජීවිතය තුළ දී ලැබූ දුක් කම් කටොළු වැනි අත්දැකීම් හෙළිදරව් කරමින් පැවිද්දෙන් පසුව රහත් බව ලබා තම ආධ්‍යාත්මය ජයගත් අවස්ථාවේ ඇති වූ හැඟීම් අව්‍යාජව ප්‍රකාශ කිරීම මෙම ගාථා මගින් හෙළිදරව් කර තිබේ. ඒ අනුව ථේරීගාථාවල තෙරණියන්ගේ ආධ්‍යාත්මික ජීවිතය පිළිබඳ වත්, ථේරගාථාවල තෙරවරුන්ගේ බාහිර ජීවිතය හා පරිසර වර්ණනා පිළිබඳවත් කරුණු බොහෝමයක් දක්නට ලැබේ. මෙම දෙකොටසෙහි පුර වැණුම්, පරිසර වැණුම්, නදී වැණුම් ආදි වර්ණනා බොහෝමයක් ඇතුළත් වී ඇති බව පෙනේ. කෙටියෙන් ගතහොත් එම සියල්ල ම පාහේ ලෝකෝත්තර ජීවිතය කෙරෙහි සිත යොමු කරවන අයුරින් නිර්මාණය වී ඇත.

යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා

කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා

පලෙහිතී ආලයමාලයෙසිනි

තදා නදී අජකරණී රමෙති මං[7]

භාවනානුයෝගීව වැඩසිටි සප්පක තෙරුන් විසින් ප්‍රකාශිත මෙම ගාථාවෙන් කියවෙන්නේ අජකරණී නදිය සප්පක තෙරුන්ගේ සිත් අලවන දසුනක් බවය. එසේම එහි කියවෙන අර්ථයෙන් බුදුදහමෙහි මූලික ඉගැන්වීමක් වන අනිත්‍ය, දුක්ඛ. අනාත්ම යන ත්‍රිලක්ෂණය පිළිබඳ ව ද කරුණු කියවෙයි. මේඝ ගර්ජනාවෙන් බිය වී පලා යන කෙකිණි සමූහයා දකින තමාගේ සිත අජකරණී නදිය කෙරෙහි ඇලෙන බවත් එයින් තමාගේ භාවනා කටයුතු සඳහා මහත් පිටිවහලක් ලැබී ඇති බවත් අව්‍යාජව ම ප්‍රකාශ කරයි. ඒ තුළින් ජීවිතයේ ඇති අනිත්‍යතාව පෙන්නුම් කරන අතර ම එකම අරමුණ වන නිවන් කරා සිත යොමු කිරීමට ද හැකි වූ බව පවසයි.

දුමානි වුල්ලානි මනෝරමානි

සමන්තතො සබ්බදිසා පවන්ති

පත්තං පහාය ඵලමාසසානා

කාලො ඉතො පක්ඛමනාය වීර[8]

කාළුදායි ථේරගාථාවල එන එක් ගාථාවක් පමණක් වන මෙම ගාථාව තුළින් හා අනෙක් ගාථා මගින් හෙළිදරව් කරන්නේ රජගහ නුවර සිට කිඹුල්වත් නුවර දක්වා ඇති මග දෙපස පරිසරය පිළිබඳ වර්ණනාවය. එම ගාථා මගින් බුදුන්ගේ සෞන්දර්යාත්මක හදවත අවදි කළ අතර පරිසරය පිළිබඳ ව ඇති හිතකාමීත්වය පුබුදුවාලීමක් ද විය. සුදොවුන් මහ රජතුමා බුදුරජුන් තම නුවරට වැඩම කරවා ගැනීම සඳහා නොයෙක් පිරිස් බුදුරජුන් වෙත යැව්වත් ඒ සියලු දෙනා ම බුදුන්ගෙන් බණ අසා පැවිදි වී රහත් වූහ. කාළුදායි ඇමතියා ද එසේ ගොස් පැවිදි වූවෙකි. එහෙත් ඔහු බුදුරජුන් වැඩම කරවීම සඳහා කාරණාව නොකියා කිඹුල්වතට යන මාර්ගය දෙපස ඇති සුන්දරත්වය වර්ණනා කර ඇත. ඒ අනුව බුදුරජුන්ට මෙම පරිසරය බැලීමට අශාවක් උපන් අතර ඒ මාර්ගයෙන් කිඹුල්වතට සම්ප්‍රාප්ත වීම ද සිදු වුණි. මෙබඳු නොයෙක් වර්ණනා ථේරගාථාවල දක්නට ලැබෙයි.

ථේරගාථාවල පමණක් නොව ථේරීගාථාවල ද සාහිත්‍යමය අතින් වැදගත් භාවගීත කොතෙකුත් දක්නට ලැබේ. පැවිදි ජීවිතය සඳහා තමන් මෙහෙය වූ ගිහි ජීවිතයේ දී ගමන්ට විඳින්නට සිදු වූ දුක් ගැහැට, සමාජයෙන් ලැබුණු අපහාස, සැමියාගෙන් විඳින්නට සිදු වූ කරදරවලින් මිදී තමන් ලැබූ නිරාමිෂ ප්‍රීතිය පැවසීමේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වී ඇති ථේරීගාථා විශ්ව සාහිත්‍යයේ එන කවර භාවගීත කාව්‍යයක් සමග වුවද සමකළ හැකිය. එහි එන මුත්තා තෙරණියගේ ගීතය රසවත් භාවගීතයකි.

සුමුත්තා සාධු මුත්තාම්හි - තීහි ඛුජ්ජේහි මුත්තියා

උදුක්ඛලෙන මුසලෙන - පතිනා ඛුජ්ජකේන ච

මුත්තාම්හි ජාති මරණා - භවනෙත්ති සමූහතා[9]

කුදු සැමියා, වංගෙඩිය හා මෝල්ගහ යන තුන් කුදයෙන් තමන් මිඳුණු බව මුත්තා තෙරණිය කියාපාන්නේ කෙතරම් රසවත් අයුරින්ද? ඇයට ගෘහ ජීවිතය අතහැර යාමට තුඩුදුන් මෙම ගැහැටවලින් මිදීමෙන් ලැබූ සැනසීම සහ දැඩි ප්‍රීතිය ''සුමුත්තා'' යනුවෙන් නැවත නැවත කියා පෑමෙන් හැඟෙයි. මෙබඳු දැව පද ඇති භාවගීත උසස් ගණයෙහි ලා සැලකෙන භාවගීතයන්ය. මෙවැනි ගාථා බොහෝමයක් ථේරීගාථාවල දක්නට ලැබේ.

මේ අනුව ථේරගාථා හා ථෙරීගාථාවල ඇති කාව්‍ය ප්‍රකාශන ලෞකිකත්වට බර නොවී හුදෙක් ලෝකෝත්තරගාමී තත්වයක්ම විදහා පායි. මේ ක්‍රමය කෙමෙන් වෙනස් වී දඹදෙණි යුගය වනවිට වෙනම ම කාව්‍ය සම්ප්‍රදායක් බිහි වී ඇත. ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේ සංස්කෘත ආභාසයයි. සංස්කෘතයෙහි කාව්‍ය නිර්මාණය වී ඇත්තේ රසවාද, ධ්වනිවාද, වක්‍රෝක්තිවාද, ගුණවාද, නීතිවාද, ඖචිත්‍යවාද වැනි වාදයන් මුල්කරගෙනය.[10] මෙබඳු රසවාදයන්ගෙන් හටගත් කාව්‍ය නිර්මාණාත්මක, ආශ්වාදජනක, විචාරාත්මක ලක්‍ෂණවලින් සමන්විත විය. එහෙත් බෞද්ධ සාහිත්‍යයේ මුල් කාව්‍ය සේ සැලකෙන උදාන, ථේරගාථා, ථේරීගාථා මෙම වාද මගින් විවේචනය කළ නොහැකිය. එසේ වීමට හේතුව නම් මුලින් පැවති ගාථාවන් සුන්දර, භාවාත්මක හැඟීම් දනවන ගාථා විශේෂයක් වීමය.

තස්මිං වනෙ වනසුරා තිජසුන්දරීහී

රම්මේ සිලාතලදහෙ සිකතාතලෙ ච

නච්චන්ති තන්ති තුරියානි ච වාදයන්ති

ගායන්ති මාලභරිනො ෂතතං පතීතා[11]

කාළුදායි තෙරුන්ගේ පරිසර වර්ණනාවට වඩා මෙම වැණුම වෙනස් ස්වරූපයක් ගනී. මුලින් කී මල් පිපෙන, කුරුල්ලන් කෑ ගසන, මල් බිම පතිත වීමෙන් සුන්දර වී ඇති ආකාරයට වඩා මෙහි කාන්තාවන් සැරිසරන, ඔවුන්ගේ ගී ගායනාව පවත්වන අයුරු පෙන්වා දීමෙන් ලෞකික ජීවිතය කෙරෙහි සිත් අලවනු ලබයි. මේ යුගයේ ඇති විශේෂත්වය ද මෙයයි. මෙවැනි තවත් ගාථා දෙකක් ලෙස

ලලනානනානී චලලොලනානී

තරුණාරුනානී චලිතාදරානී

මනුජො හි නෙත්ත පියං කරොති

සකුණී ච හොති මපිනො ජහාති[12]

බිම්බාධරාය විකචුප්පල ලොචනාය

දෙවින්ද චාප රති වඩ්ඪන භුලතාය

සම්පුණ්ණසොම්ම විමලින්දු වරානනාය

සොවණ්ණහංසයුගචාරු පයොධරාය[13]

සුන්දර ලලනාවියක් කෙරෙහි තම ඇස යොමුවන ආකාරය පළමු ගාථාවෙනුත් බිම්බාදේවිය නොහොත් මහාමායා දේවියගේ රූ සපුව වර්ණනා කළ ආකාරය දෙවන ගාථාවෙනුත් පෙන්නුම් කරයි. මෙම ගාථා දෙක ම කියවන පාඨකයා තුළ ඇති වන්නේ ලෞකිකත්වයට යොමු වූ කාන්තාවන් දෙදෙනෙකුය. මුල් කාව්‍යවල දී හමුවන සුභා තෙරණියගේ ශරීරය කෙරෙහි ලොල් වූ සල්ලාලයාට පවසන්නේ මේ සුන්දර යැයි සිතන ශරීරය අසුන්දර එකක් බවය.[14] දඹදෙණි යුගයේ කාව්‍යයන්හි ඇති විශේෂත්වය ද මෙයයි. එම බොහෝමයක් කාව්‍යවල ඇත්තේ විරාගී ස්වභාවක් නොව රාගී ස්වභාවයකි. එමනිසා මෙම කාව්‍යයෝ විශේෂත්වයක් පෙන්නුම් කරයි. කෙසේ නමුත් මුල් යුගයේ හා දඹදෙණි යුග්යේ කාව්‍ය ලෞකික ලෝකෝත්තර වශයෙන් වෙන්වුවත් එම කාව්‍යයන් මුල් කාලයේ තිබුණු බෞද්ධ සාහිත්‍යය වර්ණනාවන්ගෙන් බැහැරට ගිය බවක් දක්නට නොලැබේ. ඒ සියල්ල ඒ ආකාරයෙන් ම ඉදිරියටත් ගෙන ගොස් ඇති අයුරු දඹදෙණියේ කාව්‍ය කෘති දෙස බැලීමෙන් තහවුරු වේ.

එසේම මේ යුගයේ කාව්‍ය කෘති ඓතිහාසික වශයෙන් ද සුවිශේෂත්වයක් චරයි. ජිනචරිතය, ථූපවංසය, හත්ථවනගල්ලවිහාර වංසය, කේසධාතුවංසය, සමන්තකූටවණ්ණනා එබඳු කෘති ලෙස දැක්විය හැකිය. මේ සියල්ලෙහි ම මූලික පරමාර්ථය වී ඇත්තේ ඓතිහාසික සිද්ධීන් ගෙනහැර දැක්වීමයි. වැඩි ප්‍රමාණයක් බුද්ධචරිතය පදනම් කරගෙන රචනා වී ඇත. ඒ අතරට ඉන්දියාවේ මෙන් ම ලංකාවේ ද පැවති ආගමික, සාමාජික තොරතුරු විස්තර කිරීමට ද අමතක කර නැත. බුද්ධචරිතය වර්ණනා කිරීමේදී පාඨකයගේ සිත බුදුන් කෙරෙහි අප්‍රමාණ භක්තියක් ඇති කරවන අයුරින් රචනා කර තිබේ. ඓතිහාසික සිද්ධියක් වන දීපංකර බුදුන් වර්ණනා කර ඇති ආකාරයෙන් එය මනාව පැහැදිලි වේ.

ඡබ්බණ්ණරංසීහි විරාජමානං

දිස්වා මනුඤ්ඤං සුගතත්තභාවං

සඤ්ජාතපීතීහි උදග්ගචිත්තෝ

සම්බෝධියා ඡන්දමකාසි ධීරෝ[15]

පසේ බුදු කෙනෙකු වුවත් වර්ණනා කර ඇති ආකාරයෙන් රතනත්‍රය කෙරෙහි ම පැහැදීමක් නිතැතින් ම ඇති කරවයි. ඉහතින් සඳහන් වූ කාව්‍ය කෘතිවල එබඳු වර්ණනාවක් බොහෝ සෙයින් දැකගත හැකිය. හත්ථවනගල්ලවිහාර වංසයෙහි ඇත්තේ ලක්දිව රජ වූ සිරිසංඝබෝධි රජතුමාගේ ඓතිහාසික කථා පුවතයි. ජිනචරිතයේ ද බුදුන්ගේ ජීවන චරිතය වර්ණනා කරයි. ථූපවංසය හා කෙසධාතුවංසය ඓතිහාසික වස්තු පදනම් කරගෙන රචිතය. (මහාථූපය හා කේසධාතුන්) සමන්තකූටවණ්ණනාව ඓතිහාසික සිද්ධස්ථානයක් වන ශ්‍රී පාදස්ථානය මුල් කරගෙන රචිතය. මෙසේ ඓතිහාසික සිද්ධස්ථාන, පුද්ගලයන් හා වස්තු පිළිබඳ තොරතුරු ගෙනෙන මේ කෘති දඹදෙණි යුගයේ සුවිශේෂී ස්ථානයක් උසුලනු ලබයි.

මේ යුගයේ රචිත මහාසංඝයෙහි දෙවන කොටස ඓතිහාසික මෙන් ම, දේශපාලනික වශයෙන් ද සුවිශේෂී කෘතියකි. එහි දී ඓතිහාසික තොරතුරු ගෙනෙන අතර ම දේශපාලනික වශයෙන් එකළ පැවති තත්වය ද කියාපායි. රාජ පරම්පරා. විදේශීය බලපෑම් රට තුළ ම පැවති යුධ වාතාවරණ, රජවරු කළ මෙහෙවර ආදී ආගමික, සාමාජික තොරතුරු ගෙනහැර දැක්වීම මෙහි මූලික පරමාර්ථයයි. නොකඩවා ඉදිරියට රචනා කරන මෙම කෘතිය ලක්දිව සියලු තොරතුරු දැන ගැනීමට මහත් සේ උපකාරී වන කෘතියකි. මෙහි විශේෂත්වය වන්නේ ඇතුළත් තොරතුරු සත්‍ය හා නිවරුදි බවින් යුක්ත ව රචනා වී තිබීමය. මේ යුගයේ රචිත සියලු ම කාව්‍ය කෘති වර්ණනාවලින් ගහණව පවතින ඒවාය. සත්‍ය කථාපුවත් ගෙනහැර දැක්වීම ඒවායෙහි අරමුණ වුවත් අතිශයෝක්ති වර්ණනා බහුල ව දක්නට ලැබේ. එහෙත් මහාවංසයයෙහි එබඳු වර්ණනා වැඩි වශයෙන් දක්නට නොලැබෙයි. ඒ අනුව මෙය ඉතිහාස තොරතුරු සෙවීමේ දී සුවිශේෂී ස්ථානයක් ගන්නා කෘතියක් වශයෙන් මෙය දැක්විය හැකිය.

ආගමික වශයෙන් සුවිශේෂී කෘති කිහිපයක් ද මේ යුගයේ රචිතය. සද්ධම්මෝපායනය, රසවාහිනිය, පජ්මධූ යන කෘති එසේ දැක්විය හැකි කෘතීන්ය. ගාථාවලින් පමණක් රචිත කෘතියක් වන සද්ධම්මෝපායන තුළ දාන, සීල, භාවනා ආදී දස පුණ්‍ය ක්‍රියා හා ඒවායින් ලැබෙන ආනිසංස පිළිබඳ තොරතුරු සෙවීමේ දී මෙම කෘතිය වැදගත් තැනක් උසුලනු ලබයි. මෙය අභයගිරිවාසීන්ගේ කෘතියක් වුවත් ථේරවාදී භික්ෂූන් වහන්සේලා ද පරිශීලනය කරන කෘතියකි.

මෙහි සමහර තැන්වල ථේරවාදීන් දක්වන බුදුදහමේ කරුණුවලට වැඩි අඩු වශයෙන් කරුණු ද ඉදිරිපත් කරණු ලබයි. ථේරවාදීන් අපාය 4 ක් ගැන සඳහන් කළත්, මෙහි ඇත්තේ අපාය 3 ක් පිළිබඳ ව තොරතුරු පමණි. ''තයො අපායා ආරුප්පා'' යනුවෙන් එහි සඳහන් වේ. මෙබඳු නොයෙක් වෙනස්කම් සහිත ව රචනා වී ඇති මේ කෘතිය කාව්‍යයෙන් රචිත ධර්ම සංග්‍රහ ග්‍රන්ථ අතර සුවිශේෂී ස්ථානයක් ගනු ලබයි.

රසවාහිනී නම් ග්‍රන්ථය ද ධර්ම ආප්තෝපදේශ දීම සඳහා රචිත ධර්ම සංග්‍රහයන්ගෙන් යුත් කෘතියක් වශයෙන් දැක්විය හැකිය. ඉන්දියාවේ හා ලක්දිව ඇති වූ කථා ගෙනහැර දක්වන අතර ම ධර්මමය වශයෙන් උපදෙස් දීම ද මෙහි අරමුණක් වී ඇත. ධර්මය ඇසීමෙන්, දන් දීමෙන්, සිල් රැකීමෙන්, භාවනා කිරීමෙන් ඇති වන ඵල විපාක පිළිබඳ ව කරුණු කීමෙන් පාඨකයාගේ මනස නිරවුල් කරවන බවක් මෙහි දක්නට ලැබේ. එසේ කරන මිනිසුන් මරණින් පසු ඉපිද නොයෙක් කරදර ඇති අවස්ථාවල දී තමන් මීට පෙර භවයන්හි කළ යහපත් ක්‍රියා කලාපයන්ගේ බලයෙන් එම තත්වයෙන් මිදුනු ආකාරයන් මෙයින් පෙන්වා දෙයි.

පජ්ජමධූ කෘතිය ද ආගමික වශයෙන් සුවිශේෂත්වයක් දරණ කෘතියකි. බුදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ගෙනෙන මෙම කාව්‍යයෙන් රචිත එබඳු ගණයේ එකම කෘතිය වශයෙන් ද හැඳින්විය හැකිය. බොහෝමයක් කෘති ඇත්තේ බුදුරජුන්ගේ චරිත කථා පමණක් ගෙනහැර දක්වවන ඒවාය. ඒවායෙහි ද වැඩි වශයෙන් අතිශයෝක්ති. උපමා, රූපක වැනි අලංකාර ප්‍රයෝග දක්නට ලැබෙයි. එහෙත් මෙහි බුදුරජුන්ගේ මහා පුරුෂ ලක්ෂණ එකින් එක වර්ණනා කිරීමට එබඳු අලංකාර ප්‍රයෝග යොදා නොගනී. සංස්කෘත ආභාසය බෙහෙවින් ලැබුවත් තේරුම් ගැනීමේ දී අපහසුතාවයක් නොමැති අයුරින් රචනා කර තිබේ. එබැවින් මෙය ද දඹදෙණි යුගයේ රචිත සුවිශේෂී කෘති අතරට වැටේ.

මේ අයුරින් බලන කළ දඹදෙණි යුගයේ රචිත කාව්‍ය කෘති සියල්ලක් ම පාහේ සුවිශේෂී ස්ථානයක් දරන බව කිව හැකිය. ඒවා දේශපාලන, ආගමික, ඓතිහාසික වශයෙන් මෙන් ම සාහිත්‍යයික වශයෙන් ද වැදගත් වේ. මේ නිසා දඹදෙණි යුගයේ රචිත සෑම කෘතියක් ම පාහේ එක හා සමානව සුවිශේෂී ස්ථාන හිමිකර ගන්නා කාව්‍ය කෘති වශයෙන් දැක්විය හැකිය. ඒවායෙහි ඇති කරුණු ද බෙහෙවින් උපකාරී ඒවාය. මුල් කාව්‍ය කෘතිවලට වඩා වෙනස් ස්වරූපයක් ගත්තත් බුද්ධචරිත වර්ණනා තුළින් ඔබ්බට යාමට උත්සහ ගෙන නොමැති බව කිව හැකිය.

ආන්තික සටහන්

---

[1] සන්නස්ගල, පී. බී. සිංහල සාහිත්‍ය වංශය, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ, 1961, පි. 118.

[2] ලියනගමගේ, ඒ., මධ්‍යකාලීන ලංකා ඉතිහාසය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1981, පි. 150.

[3] මහාවංසය, (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1959, 79 පරි. 12-16 ගා. පි. 525.

[4] ලියනගමගේ, ඒ., මධ්‍යකාලීන ලංකා ඉතිහාසය, පි. 130.

[5] සන්නස්ගල, පී. බී. සිංහල සාහිත්‍ය වංශය, ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ, 1961, පි. 118.

[6] -එම- පි. 124.

[7] ථෙරගාථාපාළි, සප්පකත්ථේරගාථා, පි. 100.

[8] -එම- කාළුදායි ථෙරගාථා, පි. 152.

[9] ථේරීගාථාපාළි, මුත්තා ථේරීගාථා, පි. 06.

[10] වික්‍රමසිංහ, මාර්ටින්, රසවාදය හා බෞද්ධ කාව්‍යය. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 1961. පි. 14

[11] සමන්තකූටවණ්ණනා, (සංස්.) දෙනියායේ පඤ්ඤාලෝක හිමි, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ, 2001, ගා. 740, පි. 30.

[12] රසවාහිනී, (සංස්.) හේනපිටගෙදර ඤාණසීහ හිමි, පි. 17.

[13] ජිනචරිතය, (සංස්.) සිරි තිලකසිරි, ගා. 77, පි. 7.

[14] ථෙරීගාථාපාළි, සුභාකම්මාරධීතුථෙරීගාථා, පි. 74.

[15] ජිනචරිතය, (සංස්.) සිරි තිලකසිරි, පි. 6.

ආධුනික කථිකාචාර්ය වැලිවිට සොරත හිමි

භාෂා අධ්‍යයන අංශය,

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය,අනුරාධපුර